පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 155 /2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 27/01/2024 පැය 1325

# මාධ්‍ය නිවේදනය

## පොලිස් නිලධාරීන් ලෙස පෙනී සිටිමින් ත්‍රීරෝද රථයක් කොල්ලකෑම - බිංගිරිය පොලිස් වසම.

2024.01.26 වන දින දහවල් කාලයේදී බිංගිරිය පොලිස් වසමේ පඩිවෙල ප්‍රදේශයේ දී රුපියල් 930,000/- ක් වටිනා ත්‍රීරෝද රථයක් කොල්ලකෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් බිංගිරිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

පැමිණිලිකරු 2024.01.25 වන දින හලාවත ප්‍රදේශයට ගොස් නැවත නිවසට පැමිණෙමින් සිටියදී රාත්‍රී 10.00 ට පමණ පඩිවෙල ප්‍රදේශයේ දී මාර්ගය වම් පස සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින් දෙදෙනෙකුගෙන් එක් පුද්ගලයෙකු ත්‍රීරෝද රථයට අත දමා නවතා ඔවුන් කුලියාපිටිය පොලිසියේ බව පවසා රියදුරු බලපත්‍රය ඉල්ලා සිටි බවට පවසා ඇත. එහිදී පැමිණිලිකරු ත්‍රිරෝද රථයෙන් බැස රියදුරු බලපත්‍රය ලබාදී ඇති අතර, එම රියදුරු බලපත්‍රය ත්‍රිරෝද රථ පැදවීම සඳහා වලංගු නොවන බවත් පොලිසියට යායුතු බවත් සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින් විසින් පවසා ඇත. පැමිණිලිකරු ඊට එකඟ වීමෙන් පසු පොලිස් ස්ථානයට යාම සඳහා ඔවුන් පැමිණ සිටි යතුරු පැදියකට නංවා ගෙන ඇති අතර, අනෙක් පුද්ගලයා ත්‍රිරෝද රථය පදවාගෙන ගොස් කදුරුගස් හන්දිය ප්‍රදේශයේ දී පැමිණිලිකරු අතහැර දමා ත්‍රිරෝද රථය කොල්ලකා පලා ගොස් ඇත.

සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින් දෙදෙනා පොලිස් නිලධාරීන් නොවන බවට විමර්ශනයේ දී අනාවරණය වී ඇති අතර, සැකකරුවන් හඳුනා ගෙන අත්අඩංගුවට ගැනීම සඳහා බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් නිලධාරීන් විසින් රථවාහන නවතා පරීක්ෂා කිරීමේ දී අදාල වාහනය නැවැත්වීමට සංඥා කරන නිලධාරියා අනිවාර්යයෙන් නිල ඇඳුමින් සැරසී සිටිය යුතු බවත්, සිවිල් ඇඳුමින් සැරසී රථ වාහන නැවැත්වීම සිදු නොකල යුතු බවත් පොලිස්පතිතුමා විසින් නියෝග හා උපදෙස් ලබා දී ඇත.

ඇතැම් අවස්ථාවල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ නිලධාරීන් විසින් සිදු කරනු ලබන විමර්ශනවලට අදාලව සිවිල් ඇඳුමින් සැරසී රථවාහන නැවැත්වීමට සංඥා කරන අවස්ථා තිබිය හැක. එසේම කුලී ගමන් යාම සඳහා සිවිල් පුද්ගලයින් විසින් කුලී රථ නවතා ගැනීමට අත දමා සංඥා කරනු ලබයි. එසේ වුවද ඉහත පරිදි අපරාධකරුවන් විසින් පොලිස් නිලධාරීන් ලෙසට වංචනිකව පෙනී සිටිමින් සිදු කිරීමට ඇති අපරාධ අවම කර ගැනීම සඳහා එම අවස්ථාවට මුහුණ දෙන පුද්ලගලයින්ට අවස්ථානුකූලව තමා විසින් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ

දැනුවත්ව සිටිමින් අවදානම් ඇති අවස්ථාවල ඒ පිළිබඳව කල්පනාකාරීව කටයුතු කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් සහ රියදුරන්ගෙන් ඉල්ලා සිටියි.

එහිදී අදාල පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා හැඳුනුම්පත ඉල්ලා සිටීම, 119 හදිසි ඇමතුම් අංකය අමතා දැනුවත්කිරීම, ළඟම ඇති පොලිස් ස්ථානය දැනුවත් කිරීම, තමා නිරන්තරව සංචාරය කරන ප්‍රදේශවලට අයත් පොලිස් ස්ථානවල දුරකථන අංක තම ජංගම දුරකථනයේ තබා ගැනීම, සැකසහිත පුද්ගලයන්ගේ හඳුනා ගැනීමේ ලක්ෂණ පිළිබඳව නිරීක්ෂණය කිරීම හා ඔවුන් පැමිණ ඇති වාහන හා ලියාපදිංචි අංකයන් සටහන් කර ගැනීම සිදු කළ හැක. එසේම හැකි සෑම අවස්ථාවම අවට සිටින පුද්ගලයන්ගේ සහාය ලබා ගැනීම මෙන්ම අවස්ථාවට උචිතවන ලෙස බුද්ධිමත්ව හා කල්පනාකාරීව කටයුතු කරන ලෙසට පොලිසිය වැඩිදුරටත් දැනුම් දී සිටී.